**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම  ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පශ්චාත් උපාධි පාඨමාලා 06 කට අදාළව පාඨමාලාවන් සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාව තුළ ලැබී නොතිබුණු රු.6,002,022 ක පාඨමාලා ගාස්තු ආදායම ආයතනයේ ආදායම් ප්‍රතිපත්තියට අනුව ලියා හැරීම සිදු නොකර ලැබිය යුතු පාඨමාලා ගාස්තු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වසර තුළ පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570 හා 571 | පාඨමාලා සම්පූර්ණ කළයුතු උපරිම කාල සීමාව ඉක්මවා තිබුණු එහෙත් පාඨමාලා සම්පූර්ණ කර නොමැති සිසුන්ගෙන් අය කළ රු.2,605,260 ක ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | 2024 වසර තුළ අදාළ මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | චක්‍රලේඛ | | | |
| i | 2015 නොවැම්බර් 17 දිනැති අංක | උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විභාග පවත්වා මාස 03 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළයුතු වුවත්, ආයතනයේ පසුගිය අධ්‍යයන වසර 03 | කොවිඩ් වසංගත තත්ත්වය හා පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මාර්ග ගත | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛය | ක විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 04 සිට මාස 12 දක්වා කාලයක් ගතවී තිබුණි. | විභාග පැවැත්වීම මත ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වූ බව | |
| ii. | 2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය | සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිම සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කළ යුතු බව දක්වා තිබුණද , ඒ අනුව කටයුතු නොකර සාමාජිකයින් 35 දෙනෙකුගෙන් සමන්විතව කළමනාකරණ මණ්ඩලයක් පත්කර තිබුණි. මේ හේතුවෙන් 2019 ජනවාරි සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සඳහා එකතුව රු.1,986,000ක අමතර වියදමක් දැරීමට සිදුව තිබුණි. | කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා සංශෝධනය කරන තුරු දැනට පවතින නියමාවලිය අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.94,454,441 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.59,017,772 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.35,436,669 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් ආදායම රු.12,696,448කින් හා අනෙකුත් ආදායම් රු.32,282,760 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා 07ක් සඳහා 2020 වසරේ සිට මේ දක්වාම කිසිදු ශිෂ්‍යයකු ලියාපදිංචි කර ගෙන නොතිබුණි. | මෙම පාඨමාලාවලට ප්‍රමාණවත් අයදුම්පත් නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | උපරිම ධාරිතාවයෙන් යුතුව සිසුන් ලියාපදිංචි කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | සිසුන් 36 දෙනෙකුගෙන් ලැබිය යුතුව තිබුණු රු.854,574 ක හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව අවසන් විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබාදී තිබුණු අතර සිසුන් 12 දෙනෙකුගෙන් | කළමනාකරණ මණ්ඩලය දැනුවත් කොට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | අදාල පාඨමාලා ගාස්තු කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| අයවිය යුතුව තිබුණු රු.255,500 ක හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව ඔවුන් වෙත උපාධි සහතික පත්‍ර ප්‍රදානය කර තිබුණි. | | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමේදී මූල්‍ය ආයතන මඟින් පොලී අනුපාත පිළිබඳව මිල ගණන් කැඳවීමකින් තොරව හා වෙළඳපල පොලී අනුපාතයන්හි විචලනයන් පිළිබඳ විචක්ෂණශීලීව කටයුතු කිරීමකින් තොරව එකී බැංකුවේම ස්වයංක්‍රීයව යාවත්කාලීන කිරීම හේතුවෙන් 2022/2023 වර්ෂය තුළ ආයතනයට උපයාගත හැකිව තිබුණු රු.7,226,709 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි. | මාසික මුදල් අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකි වන පරිදි හා මාසිකව ස්ථාවර තැන්පතු කල් පිරෙන පරිදි නියමිත ප්‍රසම්පාදනයන්ට අනුකූලව මාසික පදනමින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති බව. | ආයතනයට උපරිම ප්‍රතිලාභ අත්වන පරිදි විචක්ෂණශීලීව කටයුතු කළ යුතු බව. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,495,212 ක භාණ්ඩ ඒකක 37 ක් භාවිතයට ගත නොහැකිව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | අදාළ භාණ්ඩ 2024 වර්ෂය තුලදී බැහැර කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීම සඳහා 2021 වර්ෂයේදී රු.1,310,562ක ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමේදී ගොඩනැගිලි ප්‍රමාණ මිල ගණන් (BSR) අනුගමනය කර නොතිබුණු අතර ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් මුල් ඇස්තමේන්තුව මෙන් තුන් ගුණයක එනම් රු.3,909,538 ක් වැය කිරීමට සිදුවී තිබුණි. විශ්වවිද්‍යාලය තුල ඉතා අඩු | විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීම සත්‍ය වශයෙන්ම ආරම්භ කළේ 2022 මාර්තු මසදී වන අතර මෙම කාලයේදී ගොඩනැඟිලි ආශ්‍රිත වියදම්වල සැලකිය යුතු වැඩි වීමක් ඇති වූ බව. | අරමුදල් උපරිම ඵලදායිතාවයකින් යුතුව උපයෝජනය කළ යුතුය. |

පිරිවැයක් යටතේ මෙම විදුලි ජනන යන්ත්‍ර කාමර ඉදිකර තිබියදී අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන කටයුතු නොකිරිම හේතුවෙන් ආර්ථිකමය නොවන කාර්යයක් වෙනුවෙන් රු.2,598,976ක මුදලක් වැඩිපුර දැරීමට සිදු වී තිබුණි.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවා අවශ්‍යතාවය අනුව සේවක සංඛ්‍යාව සංශෝධනයකර ගැනීමකින් තොරව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 26 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.6,791,161ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා කාර්යමණ්ඩල තනතුරු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | කාර්ය මණ්ඩලය අනුමත සීමාව තුළ පවත්වා ගත යුතුය. |